# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

பொலிஸ் ஊடகப் பிரிவு

POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 1582/ 2023

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2023

දිනය / திகதி / Date — 16/12/2023 පැය 0925

## මාධ්‍ය නිවේදනය

### ජංගම ඩිජිටල් වෝහාරික විද්‍යාගාරයක් සහිත වෑන් රථයක් රාජකාරී සඳහා නිල වශයෙන් ලබා දීම - අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව.

ශ්‍රී ලංකා පොලිසිය මගින් සිදුකරනු ලබන අපරාධ විමර්ශනයන් කඩිනම්ව සිදුකිරීම සඳහා අවශ්‍ය සහාය දැක්වීමේ අරමුණින් නිර්මාණය කරන ලද ජංගම ඩිජිටල් වෝහාරික විද්‍යාගාරයක් සහිත රථයක් 2023.12.15 වන දින වැඩබලන පොලිස්පතිවරයා අතින් රාජකාරී සඳහා නිල වශයෙන් විවෘත කරන ලදී. මෙය අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව භාරයේ ස්ථාපිත වන අතර, දිවයින පුරා සිදුවන යම් සුවිශේෂී වූ අපරාධයන් කඩිනමින් විසඳීම සඳහා එම ජංගම රථය අදාල අපරාධ ස්ථානයට ගොස් විමර්ශන කටයුතු සඳහා සහාය දක්වනු ලබයි.

නූතන තාක්ෂණික මෙවලම් වලින් සමන්විත මෙම වෝහාරික විද්‍යාගාරය සහිත වෑන් රථය අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව භාර නියෝජ්‍ය පොලිස්පතිවරයාගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන අතර, විශේෂඥ දැනුම සහිත නිලධාරීන් කණ්ඩායමක් මෙයට අනුයුක්ත කර ඇත. මෙය වැඩබලන පොලිස්පතිවරයා අතින් සුභ මොහොතින් විවෘත කරන අවස්ථාවට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී කාවින්ද පියසේකර මහතා ඇතුළු එහි ජ්‍යෙෂ්ඨ නිලධාරීන් පිරිසක් ද සහභාගී විය.







**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**